# බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
## විද්‍යාව - I

10 ශ්‍රේණිය.........

විභාග අංකය: ......................................  කාලය: පැ. 01 යි.

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ශාඛ සෛලයක් තුල පමණක් දැකිය හැක්කේ,
 i. මයිටෙකොන්ඩ්‍රියා  ii. ප්ලාස්ම පටලය
 iii. සෛල බිත්තිය  iv. සෛල ප්ලාස්මය

(02) සියළුම ජීවීන් වර්ගීකරණයට ඉතාම සුදුසු වර්ගීකරණ ක්‍රමය වන්නේ,
 i. දිලීර, ඇල්ගී, වෛරස්, බැක්ටීරියා
 ii. ශාඛ, සතුන්, ක්ෂුද්‍රජීවීන්
 iii. ක්ෂීරපායීන්, මත්ස්‍යා, පක්ෂීන්, උරගයන්, උභයජීවීන්
 iv. සීලමරේටා, මොලස්කා, ඇනලීඩා, ආත්‍රොපෝඩා

(03) තනි සෛල වර්ගයකින් පමණක් නිර්මිත පටකයක් වන්නේ,
 i. සෛල පටකය  ii. මෘදුස්ථර පටකය
 iii. ප්ලෝයම පටකය  iv. ඉහත සඳහන් සියල්ලම

(04) Zea Maize හා Pavo cristatus යන විද්‍යාත්මක නම් වලින් දැක්වෙන්නේ,
 i. අරලියා හා සැලලිහිණියා  ii. නා සහ කහ කුරුල්ලා
 iii. බඩ ඉරිඟු සහ මොණරා  iv. නිල් මානෙල් සහ වළිකුකුළා

(05) ආහාර හා ජලය සංචිත කිරීම ප්‍රධාන කෘත්‍ය වන්නේ කුමන පටකයේද?
 i. ස්ථූලකෝණාස්ථර පටකය  ii. දෘඩස්ථර පටකය
 iii. ශෛලම පටකය  iv. මෘදුස්ථර පටකය

(06) සිනිඳු පේශි පටකයේ සෛලවල දැකිය හැකි ලක්ෂණ වන්නේ,
 i. තර්කුරූපී, විලිබිත, ඒක න්‍යෂ්ඨික
 ii. තර්කුරූපී, නිර්විලිබිත, බහුන්‍යෂ්ඨික
 iii. තර්කුරූපී, නිර්විලිබිත, ඒක න්‍යෂ්ඨික
 iv. තර්කුරූපී නොවන, නිර්විලිබිත, ඒක න්‍යෂ්ඨික

(07) ශාඛ පත්‍රයක හරිතප්‍රද මගින් සිදුවන්නේ,
 i. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමයි
 ii. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය ජලය ලබා දීමයි
 iii. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය ආලෝක ශක්තිය ග්‍රහණය කර ගැනීමයි
 iv. ප්‍රභාසංස්ලේෂණය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමයි

(08) ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියේදී වායුවක් පිටවන බව හඳුනා ගැනීම සඳහා සකස් කරන ඇටවුම සඳහා යොදා ගත හැකි සුදුසුම ජලජ පැළෑටිය වන්නේ,
 i. වැලිස්නේරියා  ii. දිය හවරියා
 iii. මානෙල්  iv. හයිඩ්‍රිල්ලා

(09) ජ්ලෝයම තුලින් ශාක දේහයේ සෑම දිශාවකටම ආහාර පරිවහනය සිදුවන ක්‍රියාවලිය හඳුන්වන්නේ,

i. රසෝද්ගමනය ii. පරිසංක්‍රමනය
iii. ස්කන්ධ ප්‍රවාහය iv. අරීය පරිවහනය

(10) වැඩි සාන්ද්‍රණයක සිට අඩු සාන්ද්‍රණයක් දක්වා සන්ද්‍රණය සමාන වන තෙක් අංශු අහඹු ලෙස පැතිරීම හඳුන්වන්නේ,

i. වාෂ්පීභවනය ලෙසයි ii. ආසෘතිය ලෙසයි
iii. විසරණය ලෙසයි iv. වරණ අවශෝෂණය ලෙසයි

(11) පූටිකා සිදුර අරීම හා වැසීම පාලනය වන්නේ,

i. උත්ස්වේදනය මගින් ii. වායුගෝලයේ ඇති ජලවාෂ්ප මගිනි
iii. පාලක සෛල මගිනි iv. මූල පීඩනයේ ප්‍රතිඵලයක් ලෙසයි

(12) ශාකවල ප්‍රධාන වශයෙන්ම ජලය වාෂ්පීභවනය වන්නේ,

i. උච්චර්මය හරහා සිදුවන උත්ස්වේදනය මගින්
ii. කඳේ වා සිදුරු හරහා සිදුවන උත්ස්වේදනය මගින්
iii. පූටිකා උත්ස්වේදනය මගින්
iv. ඉහත සඳහන් ක්‍රම සියල්ලම මගින්

(13) මිනිසාගේ රතු රුධිරානු විනාශ වන්නේ,

i. ප්ලීහාව හා වකුගඩු තුලදීය ii. අක්මාවේදී හා ප්ලීහාවේදීය
iii. අක්මාවේදී හා වකුගඩු තුලදීය iv. ඇටමිදුලු වලදී ය

(14) සාර්ව ප්‍රතිග්‍රාහකයා වන්නේ,

i. A රුධිර ගණය ඇති පුද්ගලයා ii. O රුධිර ගණය ඇති පුද්ගලයා
iii. B රුධිර ගණය ඇති පුද්ගලයා iv. AB රුධිර ගණය ඇති පුද්ගලයා

(15) ඩෙංගු රෝගියෙකුට ලබා දෙන්නේ,

i. රුධිර ප්ලාස්මාව වේ ii. රුධිර පට්ටිකා වේ
iii. රුධිරය වේ iv. ඉහත සඳහන් සියල්ලම වේ

(16) හෘදයේ කපාටවල ක්‍රියාකාරීත්වයට උපකාර වන්නේ,

i. හෘද් පේෂී ii. හෘද් රජ්ජු
iii. කිරීටක ධමනි iv. කර්ණික කෝෂික ආවාරය

(17) පෙනහලු පිහිටා ඇත්තේ,

i. උරස් කුහරයේ ය ii. උදර කුහරයේ ය
iii. මහ ප්‍රාචීරය තුල iv. ඉහත සඳහන් කිසිවක් තුල නොවේ

(18) ආහාර අන්නස්‍රෝතයෙන් ආමාශයට ඇතුළු වන්නේ,

i. ආලාර චක්‍ර පිධානය හරහාය ii. හෘදාසන්න චක්‍ර පිධානය හරහා ය
iii. අපිච්ඡිකාව හරහා ය iv. ග්‍රහණිය හරහා ය

(19) ආමාශයට ඇතුළු වූ ආහාර පැය කිහිපයකට පසු ඇඹරී තලපයක් බවට පත්වේ. මේ අවස්ථාව හඳුන්වන්නේ,

i. ආහාර ගුලියක් ලෙසයි ii. ආමලසය ලෙසයි
iii. ජීර්ණ වූ ආහාර ලෙසයි iv. අර්ධ ජීර්ණ ආහාර ලෙසයි

(20) අඩුවෙන් ජලය පානය නිසා ඇතිවන රෝගී තත්වයකි

i. අර්ශස් ii. ගැස්ට්‍රයිටිස්
iii. ඇපෙන්ඩිසයිටිස් iv. මල බද්ධය

**බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ**

**පළමු වාර පරීක්ෂණය - 2012**

**විද්‍යාව - II**

10 ශ්‍රේණිය........

විභාග අංකය: ...................................... කාලය: පැ. 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) A




ඉහත දැක්වෙන්නේ පත්‍රයක හරස්කඩකි.

i. මෙහි A,B,C,D,E,F,G කොටස් නම් කරන්න.

ii. ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය වන ක්‍රියාවලියක් පත්‍රයක් තුල සිදුවේ. එම ක්‍රියාවලිය සමතුලිත රසායනික හා වචන සමීකරණයක් මගින් දක්වන්න.

iii. ඉහත ක්‍රියාවලිය සිදුවීමට අවශ්‍ය ප්‍රධාන සාධකයක් පත්‍රය තුල පිහිටයි. එම සාධකය නම් කරන්න.

iv. ඉහත iii හි සඳහන් සාධකය බහුලව අඩංගු වන ඉහත රූපයේ දක්වෙන සෛල වර්ග 2ක් නම් කරන්න.

v. අ) ඉහත iii හි සඳහන් සාධකය පත්‍රයක් තුළින් ඉවත් කර ගන්නා ආකාරය පිළිවෙලින් දක්වන්න.

ආ) මෙහි පළමු පියවරෙහි අරමුණ පහදන්න.

vi. ඔබ විසින් iii හි සඳහන් කරන ලද ක්‍රියාවලිය ජීවීන්ට වැදගත් වීමට බලපාන හේතු 2ක් සඳහන් කරන්න.

vii. ශාක පත්‍රයක උත්ස්වේදනය සඳහා බලපාන ප්‍රධාන සාධක මොනවාද?

viii. උත්ස්වේදනය අවම කිරීමට ශාක දක්වන අනුවර්තන 4ක් සඳහන් කරන්න.

ix උත්ස්වේදනය හා බිංදුදය අතර වෙනස්කම් මොනවාද?

x. උත්ස්වේදන සීඝ්‍රතාව මැනීමට භාවිත කළ හැකි උපකරණය රූපසටහනක් මගින් දක්වන්න.

B. i. පහත සඳහන් වගුවෙහි දැක්වෙන හිස්තැන් පුරවන්න.




ii. A හා B වල දක්නට ලැබෙන වෙනස්කම් 4ක් බැගින් සඳහන් කරන්න.

(02)**A** පහත දැක්වෙන්නේ රුධිරයේ අඩංගු සෛල වර්ග කිහිපයකි.




i. A,B,C පිළිවෙලින් නම් කරන්න.

ii. A, B, C මගින් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයක් බැගින් ලියන්න.

iii. රුධිරයේ ප්‍රධාන කෘත්‍යයන් 02ක් සඳහන් කරන්න.

iv. රුධිරය කැටි ගැසීම සංකීර්ණ ක්‍රියාවලියකි. තුවාලයක් සිදුවූ අවස්ථාවකදී රුධිරය කැටි ගැසීමේ ක්‍රියාවලිය පිළිවෙලින් ලියන්න.

v. ධමන හා ශිරා අතර දක්නට ලැබෙන වෙනස්කම් 3ක් ලියන්න

vi.




අ) A හා B රුධිර සංසරණයන් නම් කරන්න

ආ) හෘදයේ ඇතිවන ලබ් - ඩබ් ශබ්දය හටගන්නේ කෙසේද?

vii. හෘද රෝග ආශ්‍රිතව පහත සඳහන් වගුව පුරවන්න.

| රෝගී තත්වය | රෝගය ඇතිවීමට බලපාන සාධක |
|---|---|
| 1. හිමෝෆීලියාව | ............................................ |
| 2. .................................................. | රුධිරයේ ඇති හිමොග්ලොබින් අඩුවීම |
| 3. .................................................. | හෘද් පේෂී අකර්මන්‍ය වීම |
| 4. නහර ගැට ගැසීම | ............................................ |

**B** මිනිස් ශරීරයේ ද්‍රව්‍ය පරිවහනය සිදුවන්නේ රුධිරය මගිනි. එසේම ශාක තුළද විවිධ ද්‍රව්‍ය පරිවහනය සිදුවන්නේ ජලය මගිනි.

i. ශාක තුල ජලය පරිවහනය කෙරෙන පටකය හා ආහාර පරිවහනය කෙරෙන පටකය නම් කරන්න.

ii. ඛණිජ සහිත ජලය ශාකය තුල පරිවහනය වන්නේ කුමන ක්‍රමයක් මගින් ද?

iii. ශාකයක් ශෛලම තුළ ජල කඳක් අඛණ්ඩව පවත්වා ගැනීමට බලපාන ප්‍රධාන කරුණු දෙක මොනවාද?

iv. ශාකයක් තුළ සෑම දිශාවකටම ආහාර පරිවහනය සිදුවන ක්‍රියාවලිය හඳුන්වන්නේ කෙසේද?

(03)




ඉහත දැක්වෙන්නේ මිනිසාගේ ආහාර මාර්ගයේ කොටසකි

i. A හා B නම් කරන්න.

ii. ආහාර ජීර්ණය පහසු කිරීම සඳහා A හි දක්නට ලැබෙන ව්‍යුහාත්මක ලක්ෂ 2ක් සඳහන් කරන්න.

iii. A මගින් ආහාරයට එකතුවන එන්සයිම දෙකක් නම් කොට ඒ මගින් ජීර්ණය කරන ආහාර වර්ග ද සඳහන් කරන්න.

iv. A ආශ්‍රිතව ඇතිවිය හැකි රෝගී තත්වය කුමක්ද? ඒ සඳහා බලපාන සාධක 04ක් සඳහන් කරන්න.

v. B යනු ක්ෂුද්‍රාන්ත්‍රයේ එක් කොටසකි. එයට ඇතුළත් වන අනෙක් කොටස් 2 සඳහන් කරන්න.

vi. B ට ඇතුළුවන ආහාර භාෂ්මික තත්වයකට පත් වන්නේ කුමන යුෂ වර්ගයෙන් ද?

vii. අග්න්‍යාශයික යුෂයේ අඩංගු එන්සයිම වර්ග 03 නම් කොට එමගින් ආහාර ජීර්ණ සිදුවන ආකාරය කෙටියෙන් දක්වන්න.

viii. ආහාර ජීර්ණයේදී ඇතිවන පහත සඳහන් ද්‍රව්‍ය අවශෝෂණය කර ගන්නා ස්ථාන මොනවාද?

මේද අම්ල -
ග්ලිසරෝල් -
ග්ලූකෝස් -
ඇමයිනෝ අම්ල -

ix අහාර ජීර්ණය යනු කුමක්ද?

x. පහත දැක්වෙන කොටස්වලට ඇතිවිය හැකි රෝගී තත්ව එක බැගින් ලියන්න.

උණ්ඩුක පුච්චය -
ක්ෂුද්‍රාන්ත්‍රය -
මහාන්ත්‍රය -